**බොරලැස්ගමුව නගර සභාව - 2021**
---------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

බොරලැස්ගමුව නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බොරලැස්ගමුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) නගර සභාවේ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු බව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති හා අංක LGD/10A/4/න.ගි/2019 දරන ලිපිය අනුව දන්වා ඇතත් නගර සභාව විසින් 2021 වර්ෂයේද වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසානයට පෙර වත්කම් ප්‍රත්‍යාගණනය කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | සියළුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.35,818,405 ක් ලැබී තිබුණද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් අංක 10 යටතේ සහ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ එම ප්‍රාග්ධන ප්‍රදාන දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට පියවර ගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළ රු.22,470,773 ක ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ක්ෂය අනුපාතයට සමාන ප්‍රතිශතයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් අංක 5 යටතේ (පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම්) දැක්විය යුතු වුවත් වත්කම් හා ක්ෂය නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා එය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට පියවර ගනිමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් සටහන් අංක 5 යටතේ ඇති වටිනාකම ගැලපීමෙන් පසු ඉතිරි වටිනාකම වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරිමට පියවර ගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | සභා අරමුදලින් ක්‍රියාත්මක නොනිමි ව්‍යාපෘති 06 ක වටිනාකම තක්සේරු කර නොනිමි වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරිමට පියවර ගනිමි. | නොනිමි වැඩ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | අවිනිශ්චිත ගිණුමේ රු.14,222,618 ක හර ශේෂය සහ ශේෂ පිරික්සුමේ රු.23,792,237 ක හඳුනා නොගත් බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හා හඳුනා නොගත් ශේෂයන් හඳුනා ගැනීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුවේ. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාල ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු.1,523,010 ක් වැඩියෙන් හා රු.21,290 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දි නිවැරදි කිරිමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුවේ. |
| (ආ) | උපලේඛන අනුව සභා අරමුදලින් නිමකරන ලද ව්‍යාපෘති 30 හි වටිනාකම රු.25,419,396 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව ව්‍යාපෘති වටිනාකම රු.31,148,017 ක් වූයෙන් දේපළ, පිරියත හා උපකරණ යටතේ මාර්ගවල වටිනාකමෙහි රු.5,728,621 ක වෙනසක් නිරික්ෂණය විය. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරිමට පියවර ගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුවේ. |

## 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.8,262,821 ක් වු විවිධ තැන්පත් ශේෂය සනාථ කිරීම සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී සකස් කර ඉදිරිපත් කරමි. | නිරීක්ෂණයේ සඳහන් වටිනාකම තහවුරු කිරීම සඳහා උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,913,815 ක් වූ අතර ඊට අනුරූපීව ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,887,122 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දි ගණුදෙනුකරුවන් වෙත නිකුත් කිරිම සඳහා ලියන ලද රු.474,282 ක් වටිනා චෙක්පත් 24 ක් 2022 මැයි 27 දින තෙක් අදාළ ගනුදෙනුකරුවන් වෙත භාර දිමෙන් තොරව අත රඳවා ගෙන තිබුණි. | විගණනයේදි ගනුදෙනුකරුවන් වෙත ඉදිරිපත් කර නොතිබු චෙක්පත් සංඛ්‍යාව 24 ක් ලෙස පෙන්වා දි තිබුණද 2021.12.31 දින වන විට අපගේ ලේඛන වලට අනුව ඇත්තේ චෙක්පත් 21 ක් පමණි. එහි වටිනාකම රු.248,416 ක් වේ. රටේ පවතින අයහපත් තත්වය හා කොරෝනා වසංගතය හේතුවෙන් චෙක්පත් රැගෙන යාමට ගනුදෙනුකරුවන් ආයතනය වෙත පැමිණිමේ අඩුවක් තිබු බැවින් චෙක්පත් ලබා ගැනිමේ අඩුවක් පැවතිණි. මේ වන විට වසංගත තත්වය අඩු වෙමින් පවතින බැවින් ඉදිරියේදි අදාළ පුද්ගලයන් වෙත දැනුම් දි චෙක්පත් නිකුත් කිරිමට කටයුතු යොදන බවට දන්වමි. | ලියන ලද චෙක්පත් වහාම ගණුදෙනුකරුවන් වෙත නිකුත් කළ යුතුවේ. |

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වරිපනම් බදු ආදායම රු.27,383,560 ක් වුවද රු.9,901,089 ක් හෙවත් සියයට 36 ක් වර්ෂය තුළ අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | බිල්කළ ආදායමෙන් සමාලෝචිත වර්ෂය සඳහා සියයට 64 ක් අය කර ගෙන ඇත. ප්‍රවර්ථන වර්ෂය සඳහා අවසන් කාර්තුව නොගෙවන්නන් හට නෛතික බලය ක්‍රියාත්මක කිරීමට සිදු වනුයේම එළඹෙන වර්ෂයේ පළමු කාර්තුවේ පළමු මස 10 වන දිනට පෙරය. එසේම රට තුල පැවති 2021 වර්ෂයේ කොවිඩ් වසංගත තත්වය හේතු කොට ගෙන රට වසා තැබීම හේතුවෙන් දේපළ තහනම් කිරීමේ කටයුතු නොකරන ලද අතර මේ වන විට ගෙවීම් පැහැර හරින්නන් වෙත වරෙන්තු නිකුත් කර හිඟ අයකර ගැනීමේ කටයුතු සිදු කිරීමට නියමිතය. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | ඉකුත් වර්ෂය අවසානයට වරිපනම් ණයගැති ශේෂය රු.20,380,136 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළදී රු.7,669,054 ක් අයකර ගෙන තිබුණු අතර රු.12,711,082 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ වරිපනම් බදු ශේෂය රු.28,269,300 ක් විය. | 2021.12.31 පැවති සමස්ථ හිඟයෙන් සියයට 38 ක් අයකර ගෙන ඇත. මෙම කාල වකවානුව තුළ රටෙහි පැවති කොවිඩ් වසංගත තත්වය හේතු කොට ගෙන එම වසා තැබීම හේතුවෙන් දේපළ තහනම් කිරීමේ කටයුතු නොකරන ලද අතර මේ වන විට ගෙවීම් පැහැර හරින්නන් වෙත වරෙන්තු නිකුත් කර හිඟ අය කරගැනීමේ කටයුතු සිදු කිරීමට නියමිතය. | -එම- |

(ආ) **කුලී**

-------

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වෙළඳ ස්ථාන කුලී ආදායම රු.990,300 ක් වුවද ඉන් රු.415,554 ක් හෙවත් සියයට 41 ක් වර්ෂය තුළ අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය යටතේ 2021 අප්‍රේල් සිට අගෝස්තු දක්වා රට වරින් වර වසා දැමීම නිසා මෙම ව්‍යාපාරික ස්ථාන වසා දැමීමට සිදු විය. එබැවින් චක්‍රලේඛ ප්‍රකාරව කුලී සහන ලබා දීමෙන් අනතුරුවද නොගෙවන ලද ව්‍යාපාර ස්ථාන වෙත දැනුම් දීමේ ලිපි නිකුත් කර ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | කඩකුලී ගිවිසුමෙහි කොන්දේසි අංක 12 සහ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය අනුව වසර 05 කට වරක් කඩ කුලිය සංශෝධනය කළ යුතු වුවද 2009 වර්ෂයෙන් පසු ගාස්තු ප්‍රතිශෝධනය කිරීමක් හෝ ගිවිසුම් අලුත් කිරීමක් සිදු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී ගිවිසුම් යාවත්කාලින කිරීම සඳහා වෙළඳ ස්ථාන වල ගිවිසුම්ගත කඩහිමියන් මෙම සභාව වෙත ගෙන්වා ගිවිසුම්ගත විය යුතු බව දන්වන ලදි.<br><br>නමුත් සියළු කඩහිමියන් ගිවිසුම්ගත විම සඳහා ඔවුන්ගේ විරුද්ධත්වය පල කර රැස්වීම තුළ කළහාකාරී ලෙස හැසිරෙන ලදි. එම අවස්ථාවේදී පළාත් පාලන කොමසාරිස්තුමිය දැනුවත් කර උපදෙස් ලබා ගත් අතර ඇතිවූ තත්වය මත අදාළ කටයුතු තාවකාලිකව නතර කරන ලෙස දන්වන ලදි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (iii) | කඩකුලී ගිවිසුම් වර්ෂ 03 කට වරක් අලුත් කළ යුතු වුවද ගිවිසුම් 39 ක් එසේ කර නොතිබු අතර ගිවිසුම්ගත වීමෙන් තොරවද කඩ කාමර 03 ක් පවත්වා ගෙන ගොස් තිබුණි. | මෙම ස්ථාන වල වාහන නවතා තැබිමේ පහසුකම් නොමැති අතර පාර පුළුල් කිරිමේදි කඩ කාමර ප්‍රමාණය කුඩා වි ඇත. මෙම වෙළඳ ස්ථානය කඩා ඉවත් කිරිමට නියමිත බැවින් මාර්ග සංවර්ධනයේ දි නව ස්ථාන වල ස්ථාපිත කිරිමට යෝජනා වි ඇති බැවින් තක්සේරුවක් සිදු කරන ලදි. නව ස්ථාන ස්ථාපිත වු විට අළුතින් ගිවිසුම්ගත විමට බලාපොරොත්තු වෙමි. | ගිවිසුම් වර්ෂ 03 කට වරක් අලුත් කළ යුතුවේ. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ආරක්ෂක සේවා සැපයිම**<br>වාර්ෂිකව මිල ගණන් කැඳවීමෙන් තොරව ආරක්ෂක සේවාව සීමා සහිත රක්නා ලංකා ආයතනය වෙත ලබා ගෙන සමාලෝචිත වර්ෂයේ දී රු.6,250,419 ක් ගෙවා තිබුණි. තවද ආරක්ෂක නිලධාරින් පැය 12 ක සේවා මුර 02 ක් (දින 01) ඉක්මවා සේවයේ යෙදි තිබු අතර ඇතැම් ආරක්ෂක නිලධාරින් අඛණ්ඩව දින 10 ඉක්මවා සේවයේ යෙදී තිබුණි. | ආරක්ෂක සේවා සැපයීම ලබා ගත්තේ සිවිල් ආරක්ෂකහට පිරිස් මඟින් වුවද සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2020.01.13 දිනැති අංක CSD/08/12/01/01 දරන ලිපිය අනුව අදාළ භට පිරිස් ඉවත් කර ගෙන රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙත ආරක්ෂක රාජකාරි පැවරීම සිදු කර ඇත.<br>කෙසේ වුවද 2022 වර්ෂයේ අවසානය සිට කාර්යාංශය වෙතින් ආරක්ෂක සේවා සැපයීමට අදාළව මිළ ගණන් කැඳවා ඇත. ආරක්ෂක නිලධාරින් යොදවන්නේ අදාළ ආයතනය මඟින් වන අතර මේ පිළිබඳව රක්නා ආරක්ෂක ලංකා සමාගමෙන් විමසා ඉදිරි කටයුතු කරමි. | වාර්ෂිකව මිලගණන් කැඳවීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම සඳහා වෙළඳසැල් 161 කින් බලපත්‍ර ගාස්තු අයකර ගෙන තිබුණද 2022 ජනවාරි 31 දින තෙක් එම ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | 2021 වර්ෂය තුළ පැවති කොවිඩ් වසංගත තත්වය මත බලපත්‍ර නිකුත් කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශය නොලැබීම නිසා ඇතැම් බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රමාද වුවද ගාස්තු අය කර ගැනීමට කටයුතු කර ඇත. | වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතුවේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව පැවති දේපළ 19 න් 18 කට අයිතිය තහවුරු කිරීමට අදාළ ඔප්පු හෝ පැවැරුම් නියෝග නොතිබුණි.<br><br>එබැවින් මෙම දේපළ වෙනත් පුද්ගලයන් විසින් අනවසරයෙන් අත්පත් කර ගෙන තිබුණ ද ඒ සඳහා නිතිමය ක්‍රියා මාර්ග ගැනීම ගැටළු සහගත වේ. | විගණනයෙන් පෙන්වා දි ඇති දේපළ 18 න් දේපළ 12 ක අයිතිය තහවුරු කර ගෙන ඇති අතර එම දේපළ 12 සඳහා ඔප්පු හෝ පැවැරම් නියෝග සභාව සතුව පවති. | ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සභාව සතු ඉඩම් පිළිබඳව වාර්ෂිකව වත්කම් සමීක්ෂණයක් දිර්ඝ කාලයක සිට සිදුකර නොතිබුණු බැවින් මෙම දේපළ වල පැවැත්ම හා සභාවේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා ගෙන ඇති ආරක්ෂක පියවරයන් පිළිබඳ තොරතුරු විගණනයට තහවුරු නොවිය. | නගර සභාවේ දේපළ තහවුරු කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් කමිටුවක් පිහිටුවා ගෙන ඇති අතර එමඟින් දේපළ තහවුරු කර ගැනීමේ කටයුතු ඉදිරියේ දී සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. | වාර්ෂිකව වත්කම් සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. |
| (ඇ) | රු.1,196,310 ක් වැයකර ඉදිකරන ලද පොදු වැසිකිළි පද්ධතිය සභාව සතු වත්කමක් ලෙස ලේඛනගත කර නොතිබු අතර බදු දී සභාවට ආදායම් උපයා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | වැසිකිළි පද්ධතිය බදු දීමේ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරමි. | සභාව සතු දේපළක් ලෙස ලේඛනගත කර බදු දී ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | ගොඩනැගිලි 15 ක වටිනාකම තක්සේරු කර තිබුණද 2018 දෙසැම්බර් 31 දිනැති කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශවලට අනුකූලව තක්සේරු කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට පියවර ගනිමි. | මාර්ගෝපදේශ වලට අනුකූලව තක්සේරු කළ යුතුවේ. |